# කාලය නම් සංකල්පය

කාලය යනුවෙන් යමක් පවතින්නේ ද? කාලය ගෙවී යන බව, අප කොහේ නොගියත් වයසට යන බව, කාලය මැනගත හැකි බව අපි දනිමු. නිවැරදිව කිවහොත් අපි ඒ බව දන්නේ යැයි සිතමු. කාලය මැනීම සඳහා පෑ තැටිය, ඔරලෝසුව ආදී උපකරණ අපි යොදා ගනිමු. දැන් වෙලාව කීයදැයි ඇසුවහොත් එයට පිළිතුරක් ඇති බවත් ළඟපාත ඔරලෝසුවක් ඇත්නම් ඒ පිළිතුර දිය හැකි බවත් අපි දනිමු. එහෙත් කාලය යනු කුමක් දැයි ඇසුවහොත් අප එයට දෙන පිළිතුර කුමක් ද?

මේසය පුටුව ආදිය පවතින්නේ යැයි අපි කියමු. එහෙත් මේසය පුටුව ආදිය ද අපෙන් තොරව පවතින දෑ නො වේ. ඒ වස්තු අපෙන් තොරව පවත්නා ඊනියා බාහිර ලෝකයක පවතින දෑ නො වේ. **අපේ මනසින් තොරව පවත්නා බාහිර ලෝකයක් ඇති බව මනසින් ස්වායත්තව පෙන්වා දිය හැකි අයකු මේදියත නැත.** බාහිර ලෝකයක් ගැන අපට ඇත්තේ දැනුමකි. බාහිර ලෝකයක් ඇතැයි අපි කියමු. ඉන් අදහස් කරන්නේ බාහිර ලෝකයක් ගැන දැනුමක් අපට ඇති බව ය.

මෙහි දී පෘථග්ජනයන් කරන වැරැද්ද නම් ඊනියා බාහිර ලෝකය ඒ පිළිබඳ දැනුමෙන් වෙන් කිරීම ය. බාහිර ලෝකය ඒ පිළිබඳ දැනුමෙන් ස්වායත්ත ව පවතින්නේ යැයි අපි කියමු. එසේ කියන්නේ බාහිර ලෝකයක් ඒ අයුරින් පවතින බව දැනගෙන නො වේ. එයට ප්‍රධාන හේතුවක් වී ඇත්තේ මේසය, පුටුව ආදී වස්තු අප ඉපදෙන්නට කලින් මෙන් ම මියගියාට පසුව ද තිබෙන්නේ යැයි අප උපකල්පනය කිරීම ය.

මේසය පුටුව ආදිය ටික කලක් ගතවීමෙන් දිරාපත් වන බව පැහැදිලි ය. එහෙත් අප සිටියත් නැතත් මේසය හා පුටුව හෝ වෙනත් මේසයක් හා පුටුවක් හෝ අපෙන් තොරව පවතින්නේ යැයි අපි කියමු. අවශ්‍ය නම් කෙනකුට කිව හැක්කේ දිරාපත් වීම වුව ද අපෙන් තොරව සිදුවන බව ය. කෙටියෙන් කියන්නේ නම් අප ජීවත් වුවත් නැතත් බාහිර ලෝකයක් පවතින්නේ යැයි අපි කියමු.

එහෙත් මේ දැනුමක් පමණක් බව බොහෝ දෙනා තේරුම් නො ගනිති. අප මේසය යැයි කියන්නේ කුමකට ද? අපට මේසයක් ගැන ඇත්තේ දැනුමකි. ඒ දැනුම වෙනස් වූ කල එතැන හෝ කොතැනක හෝ මේසයක් නැත. මේසය යන්නෙන් අප හඳුන්වන දෙයක් නැත. වෙනත් අයුරකින් කියන්නේ නම් මේසය වෙනුවට අප වෙනත් වචනයක් යොදා ගත්ත ද නැත් ද පවතින දෙයක් නැත. මෙහි දී කිසිවකුට ඇසිය හැකි ප්‍රශ්නයක් නම් මිනිසුන් වචන තනාගැනීමට පෙර ඒ ඒ දේ නොපැවතියේ ද යන්න ය. වචන නැති වුවත් මිනිසුනට යම් යම් සංකල්ප වේ. ඒ සංකල්ප චිත්තරූප වේ. කතා නොකරන බිළිඳකුට වුව ද සංකල්ප ඇත. බිළිඳා සංකල්පයකින් තොරව තම මව හඳුනාගන්නේ කෙසේ ද?

බිළිඳුන්ට පමණක් නොව සතා සිවුපාවාට ද සංකල්ප වෙයි. කෙටියෙන් කිවහොත් මනසක් ඇති සත්වයනට සංකල්ප වෙයි. බිළිඳාට මේසය යන වචනය නැත. එහෙත් ඒ පිළිබඳ බිළිඳාට ද යම්කිසි සංකල්පයක් වෙයි. ඒ ඔහුගේ චිත්තරූපයක් ඔස්සේ ලැබෙන්නකි. මෙයින් කියැවෙන්නේ බිළිඳාගේ මේසය හා වැඩිහිටියාගේ මේසය යනු එකක් බව නො වේ. බිළිඳාට බොහෝ විට ඇත්තේ එක් මේසයක් පමණකි. එහෙත් වැඩිහිටියන්ට මේස රාශියක් වේ. ඔහුට ඇත්තේ මේසය පිළිබඳ සාධාරණ (පොදු යන අර්ථයෙන්) සංකල්පයකි. ගෙදර ඇති මේසය ඒ මේසවලින් එකක් පමණකි. එහෙත් බිළිඳාට ගෙදර ඇති මේසය එකම මේසය (ඔහුගේ සංකල්පය) වෙයි. බිළිඳාට සාධාරණ මේස නැත. වියුක්ත මනසක් ඇති බිළිඳකුට මේස කිහිපයක් දැකීමෙන් පසුව මේසය පිළිබඳ සාධාරණ සංකල්පය ඇති කරගැනීමට නොහැකි යැයි මෙයින් නො කියැවෙයි.

එහෙත් ප්‍රශ්නය වනුයේ මේ සංකල්පවලින් බාහිර ව මේසය යනුවෙන් හැඳින්වෙන දෙයක් ඇත් ද යන්න ය. එසේ මේසය යනුවෙන් හැඳින්වෙන දෙයක් ඇතැයි අප සිතන්නේ ඇයි? එසේත් නැත්නම් එලෙස මේසයක් යනුවෙන් හැඳින්වෙන දෙයක් ඇති බව අප දන්නේ කෙසේ ද? අප සිටියත් නැතත් මේසය තිබේ යැයි අප සිතන්නේ ඇයි? අපි මේ සෑම තැනකදීම දන්නේ කෙසේ ද සිතන්නේ ඇයි ද ආදී ප්‍රශ්න නගමු.

© Prof. Nalin De Silva

මෙයින් පැහැදිලි වන කරුණක් නම් පැවතීම දැනුම හා සම්බන්ධ බව ය. අප මිය ගියත් වස්තු පවතින්නේ යැයි අප කියන්නේ අප ඒ බව දන්නා බැවිනි. කිසිවකුටවත් දැනීමකින් තොරව පැවැත්මක් ගැන කිව නො හැකි ය. බිළිඳුන්ට හා සත්වයනට ද ඒ එසේම යැයි අපි කියමු. පැවැත්ම යනු අවසාන වශයෙන් ගත්කල ඒ පිළිබඳව ව වූ අපේ දැනුම යැයි කිවහැකි ය. වෙනත් වචනවලින් කියන්නේ නම් දැනුමෙන් තොර පැවැත්මක් නැත.

අපි බාහිර ලෝකය යැයි හැඳින්වෙන්න පැත්තකට දමමු. මා පවතින බව මා දන්නේ කෙසේ ද යන ප්‍රශ්නය අපි එහි දී නගමු. දෙකාරතේ නම් ප්‍රංශ දාර්ශනිකයා මම සිතමි, එබැවින් මම වෙමි යැයි පැවසීය. ඔහුට අනුව මා පවතින්නේ (ජීවත්වන්නේ) මා සිතන බැවිනි. එහෙත් මෙහි දී කියැවෙන්නේ මා පවතින බව දන්නේ මා සිතන බැවිනි යන්න ය. මා සිතන නිසා මනසින් තොරව මා නම් අයකු පවතින බව මා නිගමනය කරන්නේ කෙසේ ද?

මා ද බාහිර ලෝකය ද යනුවෙන් හැඳින්වෙන දෑ පවතින්නේ ය යනු අනුමානයක් (inference) හෝ ප්‍රත්‍යක්‍ෂයක් හෝ පමණකි. ඒ අනුමානයක් වුවත් ප්‍රත්‍යක්‍ෂයක් වුවත් එයට මනස සම්බන්ධ වෙයි. මනස නොමැතිව අනුමානයක් හෝ ප්‍රත්‍යක්‍ෂයක් හෝ නැත. මම ප්‍රත්‍යක්‍ෂයෙන් බාහිර ලෝකයක් පවතින බව දනිමි කියන විට ඉන් කියැවෙන්නේ මනස ආධාරයෙන් බාහිර ලෝකය පවතින බව මම දනිමි යන්න ය. මා පවතින බව ජීවත්වන බව මා දන්නේ මනස නිසා ය. මනසක් නොමැති ව කිසිවක් හෝ කිසිවකු හෝ පවතින බව මට දැනගත නො හැකි ය.

මා නැති කළ , එනම් මා මියගිය පසු බාහිර ලෝකය පවතින්නේ ද? මා මියගිය පසු මට ඒ බව වෙනත් භවයක දී මිස වෙනත් අයුරකින් දැනගත නො හැකි ය. මා මිය යෑමෙන් පසු වෙනත් මන්දාකිණියක උපත ලබන්නේ නම් හා එවිට මට ලංකාව ඇතුළු පෘථිවිය ගැන දැනගැනීමට ක්‍රමයක් නැත්නම් එයින් කියැවෙන්නේ පෘථිවිය නොපවතින බව ද? ඒ ප්‍රශ්නයට පිළිතුරු දිය හැක්කේ ඒ අනෙක් භවය ගැන මා දන්නේ නම් පමණකි. අපි ඒ ප්‍රශ්නය ආපසු හරවමු. වෙනත් මන්දාකිණි පවතින්නේ ද? අද මෙලොව ජීවත්වන බොහෝ අය වෙනත් මන්දාකිණි පවතින බව දනිති. ඒ බටහිර තාරකා විද්‍යාවෙන් ලබාගත් දැනුම ආධාරයෙනි. බටහිර තාරකා විද්‍යාව පිළිගන්නා තෙක් අපට වෙනත් මන්දාකිණි පවතින බව අනුමාන කළ හැකි ය. එහි දී ද කියැවෙන්නේ වෙනත් මන්දාකිණි පිළිබඳ දැනුමක් ගැන ය. බෞද්ධයන් (වාස්තවික ව නොව) සහසක් සක්වළ ගැන දැන සිටි බව අවධාරණය කළ යුතු ය.

මේ දැනුම අපි සංකල්ප ඇසුරෙන් ලබා ගන්නෙමු. ඒ ඒ දැනුම් පද්ධතියෙන් කියැවෙන්නේ එකම දැනුමක් නො වේ. වෙනත් වචනවලින් කිවහොත් ඒ ඒ දැනුම් පද්ධතිය අනුව බාහිර ලෝකය වෙනස් වෙයි. මා ද දැනුම් පද්ධතිය අනුව වෙනස් වෙයි. බෞද්ධයනට අනුව ආත්මයක් නැත. එහෙත් වෙනත් බොහෝ ආගමිකයනට අනුව ආත්මයක් වෙයි. එනම් ඔවුන්ට මා යනුවෙන් සැලකිය හැකි සාරයක් (දෙයක්) වෙයි. මා මිය ගිය ද ඒ සාරය වෙනස් නො වෙයි. එය මේසය යනුවෙන් දෙයක් (සාරයක්) ඇතැයි කීමට සමාන ය.

බාහිර ලෝකය ද මා ද මගේ නිර්මාණ වෙයි. ඒ සියල්ල මගේ සංකල්පීය දැනුම ය. සංකල්ප යනු මනස ඇසුරෙන් මා නිර්මාණය කරන දෑ ය. වෙනත් වචනවලින් කිවහොත් මුළු ලෝකයම පවතින්නේ බඹයක් පමණ වූ මගේ සිරුරෙහි ය. ඒ බව දේශනා කෙළේ බුදුන් වහන්සේ ය. බඹයක් පමණ වූ සිරුරෙහි මුළු ලෝකයම පවතින්නේ යැයි, පනවන්නේ යැයි, දේශනා කිරීමේ තේරුම කුමක් ද? අප සියළු දැනුම් ලබාගන්නේ සංකල්පීයව ය. ඒ සංකල්ප අපේ නිර්මාණ වෙයි. මේ සංකල්ප නිර්මාණයෙහි දී අප ආධාර කරගන්නේ මනස හා අනෙක් ඉන්ද්‍රිය පහ ය. මනස ද ඉන්ද්‍රියක් වුවත් අපි බොහෝ විට මනස හා පංචෙන්ද්‍රිය යන්න යොදා ගනිමු. යමකුගේ ලෝකය යනු ඒ අයගේ මනස හා පංචේන්ද්‍රියන් ඇසුරෙන් නිර්මාණය කෙරුණු සංකල්ප (හා ප්‍රවාද) මිස අන් කිසිවක් නො වේ.

කිසිම ආකාරයක මනස් ඇති සත්වයන් මෙලොව නො වී යැයි සිතමු. එසේ නැතහොත් එවැනි යුගයක් තිබිණි යැයි සිතමු. එවන් අවස්ථාවක ලෝකයක් නැත් ද යන ප්‍රශ්නය ඇසිය හැකි ය. පළමු කොටම කිවයුත්තේ මනසක් නැති සත්වයන් නොමැති ලොවක් ඇතැයි සිතිය නොහැකි බව ය. බටහිර විද්‍යාවට අනුව නම් පළමු සත්වයා ලොව බිහිවන දිනයක් ඇත. අජීවයෙන් ජීවය හටගැනීම පිළිබඳ බටහිර විද්‍යාඥයෝ විවිධ ප්‍රවාද නිර්මාණය කරති. එහෙත් මේ සියල්ල පළමු ජීවය, පළමු තැනැත්තා ආදී වශයෙන් ගෙන එක්තැනක සිට එක රේඛීයව විකාශය වන ආකෘති තනන

© Prof. Nalin De Silva

බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි බිහි වූ දෑ ය. අගක් මුලක් නැති චක්‍රිය ලෝක ඇති බෞද්ධයනට පළමු සත්වයා පිළිබඳ සංකල්පයක් නැත.

එහෙත් අපට එවැනි ප්‍රශ්නයකට මෙවැනි පිළිතුරක් ද දිය හැකි ය. අපේ ප්‍රවාදවලට හසු නොවන සංකල්ප නොමැති ලෝක තිබෙන්නට බැරි ද? උදාහරණයක් ලෙස බටහිර විද්‍යාඥයන්ට දැනට අවුරුදු අසූවකට පමණ පෙර අපේ මන්දාකිණියෙන් බාහිර විශ්වයක් ගැන දැනුමක් නොතිබුණි. දැන් ඔවුන්ට එවැනි විශ්වයක් ගැන යම් සංකල්ප හා ඒ ඇසුරෙන් ගොඩනගාගත් ප්‍රවාද ඇත. බටහිර විද්‍යාඥයන් ඒ ප්‍රවාද හා සංකල්ප ඇතිකරගැනීමට පෙර එවැනි ලෝකයක් තිබිණි ද? අපට කිව හැක්කේ බටහිර විද්‍යාඥයන්ට එවැනි ලෝකයක්, විශ්වයක් නොතිබූ බව ය. අද ද අපට සංකල්ප නොමැති හිඩැස් අනන්ත අප්‍රමාණ සංඛ්‍යාවක් තිබෙනු ඇත. එහෙත් ඒ තිබේ ද නැත් ද යන්න අපි නො දනිමු. අපට ඒ පිළිබඳ දැනුමක් නැත. අපේ සංකල්පීය ලෝකයෙන් පරිබාහිර ලෝකයක් පිළිබඳ අපට කිසිම අදහසක් නැත. ලෝකය යනු සංකල්පීය ලෝකය ( ඒ සංකල්ප ඔස්සේ ගොඩ නැගුණු ප්‍රවාද සහිතව) මිස අනෙකක් නො වේ. මේ සංකල්පීය ලෝකය අවසාන වශයෙන් ගත්කල මනසේ නිර්මාණයකි. එපමණක් නොව මනස ද මනසේ නිර්මාණයකි. කිසිවකට වාස්තවික වූ පැවැත්මක් නැත යන්න මේ සියල්ලෙන් කියැවෙයි. පටිච්චසමුප්පාදායට අනුව A වේ නම් B වේ A නොවේ නම් B නො වේ යැයි කියනු හැරෙන්නට වෙනත් දෙයක් අපට කිව නො හැකි ය.

සංකල්ප ඇතිවීමේ දී නිර්මාණය කිරීමේ දී මනස ප්‍රධාන වෙයි. එහෙත් ඇතැම් සංකල්ප ඇතිවීමට මනස හැරෙන්නට වෙනත් ඉන්ද්‍රියක් හෝ ඉන්ද්‍රිය හෝ අවශ්‍ය වෙයි. මේසය යන සංකල්පය ඇති කරගැනීමේ දී මනස මෙන් ම ස්පර්ශය ද ඇස ද අවශ්‍ය වෙයි. මේසයේ ගඳ සුවඳ දැනගැනීමට නම්, අදාළ සංකල්පය නිර්මාණය කරගැනීමට නම් නාසය ද අවශ්‍ය වෙයි. ඒ එසේ වුවත් ඇතැම් සංකල්ප ඇතිකරගැනීමට සෘජුව හෝ වක්‍රව හෝ වෙනත් ඉන්ද්‍රියක් අවශ්‍ය නො වෙයි. එවැනි සංකල්පවලට අපි බුද්ධඝෝෂ හිමියන් අනුව යමින් පඤ්ඤත්ති යැයි කියමු. එවිට පඤ්ඤත්තියක් යනු වෙනත් ඉන්ද්‍රියක් සෘජුව හෝ වක්‍රව හෝ ඇසුරු කර නොගනිමින් නිර්මාණය කරන පනවන සංකල්පයකි. පඤ්ඤත්ති යන්නෙන් පැනවීම අදහස් කෙරෙයි.

අපට චුම්බකත්ව හෙවත් කාන්දම් ගුණය සෘජුව ඉන්ද්‍රියවලට නො දැනෙයි. එහෙත් කාන්දමකට ලෝහ කැබැල්ලක් ඇදී යයි. අපි ඒ අනුසාරයෙන් වක්‍රව කාන්දම් “දකිමු”. චුම්බකත්ව යන්න අප මනස හා අනෙක් ඉන්ද්‍රිය උපයෝගී කරගෙන වක්‍රව තනාගත් සංකල්පයකි. ඒ මේසය වැනි සෘජුව තනාගත් සංකල්පයක් නො වේ. පොල් ගෙඩියක් වැටෙනු දැක අපි ගුරුත්වාකර්ෂණය නම් සංකල්පය නිර්මාණය කර ගන්නෙමු. ගුරුත්වාකර්ෂණය ද වක්‍ර සංකල්පයකි. එපමණක් නොව පරමාණුව ආදී අපේ පංචේන්ද්‍රියනට සෘජුව ගෝචර නොවන සංකල්ප ද වක්‍ර සංකල්ප වෙයි. මෙහි දී කිව යුත්තක් නම් ඇතැම් දර්ශනවාදී ගුරු කුලයක සෘජු සංකල්පවලට පමණක් පැවැත්මක් ඇතැයි ගන්නා බව ය. විශේෂයෙන් ම මාක් නම් ඕස්ට්‍රියානු දාර්ශනිකයාගේ පුරෝගාමීත්වයෙන් බිහි වූ ඉන්ද්‍රියානුභූතවාදය (positivism) මෙහි ලා සඳහන් කළ යුතු ය. එහෙත් බෞද්ධයනට මේ සෘජු හා වක්‍ර සංකල්ප පිළිබඳ විශේෂත්වයක් නොමැත්තේ ඒ සියල්ල අවසානයේ දී මනසේ නිර්මාණ වන බැවිනි.

කාලය යන්න පඤ්ඤත්තියක් යැයි බුද්ධඝෝෂ හිමියෝ අත්ථසාලිනියෙහි සඳහන් කළහ. අප පඤ්ඤත්තිය යන සංකල්පය නිර්මාණය කරගත්තේ උන්වහන්සේ අනුව යමින් උන්වහන්සේගේ නමට කරන ගෞරවයක් ලෙස ය. කලින් සඳහන්කර ඇති පරිදි පඤ්ඤත්තියක් යනු වෙනත් ඉන්ද්‍රියක් සෘජුව හෝ වක්‍රව හෝ යොදා නොගනිමින් මනසින් පමණක් නිර්මාණය කරන සංකල්පයකි. සූත්‍ර දේශනා අනුව කාලය යන සංකල්පය අපට ඇතිවන්නේ කරුණු දෙකක් නිසා බව මහාචාර්ය ඩේවිඩ් කළුපහන මහතා සඳහන් කර ඇත. එකක් වෙනස්වීම ය. අනෙක අපට මතකයක් තිබීම ය. කිසිවක් වෙනස් නොවන්නේ නම් අපට කාලය යනුවෙන් සංකල්පයක් අවශ්‍ය නො වේ. අපි ඇතැම් විට කාලයත් සමග යමක් වෙනස්වන්නේ යැයි කියමු. එහෙත් කාලය යන සංකල්පය වෙනස්වීම නිසා නිර්මාණය කරගනු ලැබූ සංකල්පයක් බව අපට අමතක වෙයි. කාලයත් සමග වෙනස්වන්නකු හෝ වෙනස්වන්නක් හෝ නැත. වෙනස්වීම නිසා කාලය ඇත.

එහෙත් වෙනස් වූ පමණින් ද කාලය යන සංකල්පය නිර්මාණය නො වේ. කාලය යන සංකල්පය නිර්මාණය කිරීමට හේතු වී ඇත්තේ අපට මතකයක් තිබීම ය. අප කුඩා කල ජීවත් වූ ආකාරය අපට මතක ය. අප ගතකල පාසල්

© Prof. Nalin De Silva

ජීවිත පිළිබඳ අපට මතකයක් වේ. වෙනස්වීම වෙනස්වීමක් වන්නේ මතකය නිසාය. අපට මතකයක් නැත්නම් අප ග්‍රහණය කරගන්නේ මේ මොහොත පමණකි. එවිට කාලය නම් සංකල්පයක අවශ්‍යතාව පැන නො නගියි. අපි මෙහි දී මොහොත යන වචනය යොදා ගත්තෙමු. එහෙත් අපට මතකයක් නොතිබිණි නම් කාලය නම් සංකල්පය පමණක් නොව මොහොත යන සංකල්පය ද අපට නැත. අප බොහෝ දෙනාට පෙර භව ගැන කිසිම මතකයක් නැත. සසර යන සංකල්පය අප තනාගෙන ඇත්තේ ඒ පෙර භව ගැන දැකගත හැකි අය ඒ පිළිබඳ ව කියා ඇති බැවින් හා ඔවුන් ගැන අපට විශ්වාසයක් ඇති බැවිනි. අප කිසිවකුට පෙර භව නොපෙනුනා නම් සමහරවිට සසර යන සංකල්පය අපට නැතිවීමට ඉඩ තිබිණි. බටහිරයන් බොහෝ දෙනාට සසර යනුවෙන් සංකල්පයක් නැති බව මෙහි දී අවධානයට ලක්විය යුතු ය.

කිසිම සංකල්පයක ඊනියා වාස්තවික පැවැත්මක් ගැන බෞද්ධයෝ විශ්වාස නො කරති. සෘජු සංකල්පයක් වූ මේසය, වක්‍ර සංකල්පයක් වූ චුම්බකත්වය, පඤ්ඤත්තියක් වූ කාලය ආදී කිසිවකට ඊනියා වාස්තවික පැවැත්මක් නැත. එහෙත් මේසය අපට දැකගත හැකි ය. එනම් මේසය ඉන්ද්‍රිය ගෝචර වෙයි. චුම්බකත්වය දැකගත නො හැකි ය. එනම් චුම්බකත්වය ඉන්ද්‍රිය ගෝචර නො වෙයි. එහෙත් මේසයටත් කාන්දමටත් භෞතික පදනමක් වේ යැයි අපි කියමු. ඒ භෞතික පදනම වුවත් සාපේක්ෂ බව අවධාරණය කළ යුතු ය. එහෙත් කාලය සම්බන්ධයෙන් කිව හැක්කේ කුමක් ද? සාමාන්‍යයෙන් භෞතික ගුණ ක්වොන්ටම් භෞතිකයෙහි දී හිල්බට් අවකාශයෙහි කාරක (operators) ලෙස නිරූපණය වෙයි. එහෙත් එහි කාලය කාරකයක් නො වේ. කාලයට සාපේක්ෂව වුවත් භෞතික පදනමක් නැත.

කාලය යන්න සාපේක්ෂ වුවත් භෞතික පදනමකින් තොරව අප විසින් පනවාගනු ලැබූ සංකල්පයකි. වෙනස්වීම හා මතකය නොවන්නට අපට කාලය යන්න වැදගත් නො වේ. අල්පෙනෙත්තක් කාන්දමකට ඇදී යන්නේ චුම්බකත්වය නිසා බවත් පොල් පොළොවට වැටෙන්නේ ගුරුත්වාකර්ෂණය නිසා බවත් අපි කියමු. ඉන් අදහස්වන්නේ එවැනි ගුණ වාස්තවිකව පවත්නා බව නොවේ. කෙසේ වෙතත් කාලය යන සංකල්පය යොදාගෙන අප තේරුම් ගන්නේ කිනම් ප්‍රපංචයක් ද? කාලයත් සමග වයසට යන්නේ ය යන්න වැඩිම වුවහොත් පුනරුක්තියක් (tautology) පමණකි.

එහෙත් බටහිරයන්ට කාලය යන්න භෞතික පදනමක් ඇති සංකල්පයකි. ඔවුන්ට අනුව කාලය යනුවෙන් ඉදිරියට ඇදී යන ප්‍රපංචයක් වෙයි. අද ඇතැම් බටහිර භෞතික විද්‍යාඥයෝ කාලය ඉදිරියට පමණක් යන්නේ ඇයි ද යන්න තේරුම් ගැනීමට උත්සාහ කරති. ඔවුන් කාලයේ ඉදිරි ගමනට නමක් ද පටබැඳ ඇත. ඒ කාල හීය (arrow of time) වෙයි. අප කාලය යන සංකල්පය පනවා ඇත්තේ ඉදිරියට යන්නක් ලෙස බව බටහිරයන් තේරුම් නොගන්නේ කාලයෙහි කිසිදු භෞතික පදනමක් නැති බව අවබෝධ කර නොගන්නා බැවිනි.

නලින් ද සිල්වා

© Prof. Nalin De Silva